# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1777/33 - 2012 සැප්තැම්බර් මස 26 වැනි බදාදා - 2012.09.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### කාර්ය පටිපාටික රීති

### 1 වැනි කාණ්ඩය

178 වැනි වගන්තිය සංශෝධනය කිරීම

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 12/0745/523/025 අනුව 2012 ජූනි මස 27 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, අංක 1589/30 හා 2009.02.20 වැනි දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති I වැනි කාණ්ඩයේ 178 වැනි වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

178. (i) කිසියම් නිලධාරියෙකු වයස අවුරුදු 57 ඉක්මවා සේවයේ යෙදීමට අදහස් කරන්නේ නම් සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස දක්වා සේවයේ රැඳී සිටීමට නිලධරයාට ඉඩ දෙනු ලැබේ.

(ii) අවුරුදු 55 සිට 60 අතර කාලපරිච්ඡේදය තුළ නිලධරයාගේ අභිමතය පරිදි මාස 03ක කල්දීමක් කර විශ්‍රාම යෑමේ අයිතිය නිලධරයාට ලබාදෙනු ඇත.

(iii) අවුරුදු 57න් පසුව නිලධරයාගේ කාර්යක්ෂමතාව හා සේවා තත්ත්වය සතුටුදායක නොවන බව අදාළ පත්කිරීම් බලධරයා තීරණය කරන්නේ නම් එයට එරෙහිව නිලධරයාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සැලසෙන ආකාරයෙන් මාස 06ක් කල් දීමකින් පසුව විශ්‍රාම ගැන්වීමේ බලය පත් කිරීම් බලධරයා වෙත පවරනු ලැබේ.

එතකුදු වුවත්,

(iv) නිලධරයාට එරෙහිව විනයානුකූල කටයුතු සිදු කෙරෙමින් පවතින විටෙක හෝ විනයානුකූල කටයුතු කිරීමට අදහස් කර ඇති විටෙක නිලධරයා විශ්‍රාම ගැන්විය යුත්තේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වගන්තියට යටත් කොට වන්නේ ය. රජයේ නිලධරයන් විශ්‍රාම ගැන්වීම සඳහා ඉල්ලීම් කරන අවස්ථාවන්හිදී මෙම කරුණු පත් කිරීම් බලධරයාගේ අවධානයට යොමු කිරීම දෙපාර්තමේන්තු ප්‍රධානගේ හා/හෝ ආයතන ප්‍රධානගේ වගකීම වන්නේ ය.

(v) පත් කිරීම් බලධරයා විසින් රජයේ නිලධරයෙකුගේ විශ්‍රාම ගැන්වීම අනුමත කිරීමෙන් අනතුරුව, විනයානුකූලව ක්‍රියාකළ යුතු වන වරදක් නිලධරයා විසින් සිදුකර ඇති විටෙක, එම කරුණු විශ්‍රාම ගැන්වීම බලාත්මක වීමට පෙර පත් කිරීම් බලධරයාගේ අවධානයට යොමු කළ හොත්, එවිට සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12

වගන්තියට යටත් විශ්‍රාම ගැන්වීමක් ලෙසට පරිවර්තනය කිරීමට හා එම නියෝගයේ පිටපතක් නිලධරයා වෙත ලබාදීමට හෝ ලැබීමට සැලැස්වීමට පත් කිරීම් බලධරයා ක්‍රියා කළ යුතු වන්නේ ය.

(vi) නිලධරයාට එරෙහිව පවත්නා විනයානුකූල පියවර නොමැති වීම හා විනයානුකූල කටයුතු කිරීමට අදහසක් නොමැති වීම යන කරුණු මත, පත් කිරීම් බලධරයා විසින් රජයේ නිලධරයෙකු සාමාන්‍ය පරිදි විශ්‍රාම ගැන්වීම අනුමත කර ඇති විටෙක, එවැනි විනයානුකූල පියවර නිලධරයාට එරෙහිව ගනිමින් පවතින බව හෝ ගැනීමට අදහස් කර ඇති බව, එම සාමාන්‍ය පරිදි විශ්‍රාම ගැන්වීම අනුමත කළ දිනට පසුව හා විශ්‍රාම ගැන්වීම බලාත්මක වන දිනට පෙරාතුව පත් කිරීම් බලධරයාගේ අවධානයට යොමු කළ හොත් එම සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වැනි වගන්තියට යටත් විශ්‍රාම ගැන්වීමකට පරිවර්තනය කිරීමට හා එම නියෝගයේ පිටපතක් නිලධරයා වෙත ලබා දීමට හෝ ලැබීමට සැලැස්වීමට පත් කිරීම් බලධරයා ක්‍රියා කළ යුතු වන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී. එම්. එල්. සී. සේනාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක 177, නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05,
2012 සැප්තැම්බර්.

10-531

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.